" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone 011 - 2093000

ISO 9001 SLSI · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/06-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2022.12.29

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ අංක 07/2022

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධානනීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>රාජ්‍ය සේවයේ ස්වේච්ඡා බල හමුදාවේ හෝ ස්වේච්ඡා උප සේවයේ සේවය සඳහා පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2017 ට සමගාමීව මෙම පාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආරක්ෂක හමුදාවල ස්වේච්ඡා බල හමුදාවේ හෝ ස්වේච්ඡා උප සේවයේ සාමාජිකයෙකු වීමට අදහස් කරන පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු හෝ එම බල හමුදාවේ හෝ උප සේවයේ සාමාජිකයෙකු වන එවැනි තැනැත්තෙකු, අදාළ හමුදා ආඥාපතිගේ ලියවිල්ලක් හෝ එවැන්නක් නිකුත් කිරීමට ඔහු වෙනුවට නිසි පරිදි බලය පැවරෙන යම් බලධරයෙකුගේ ලියවිල්ලක් මත, නිදහස් කරනු ලැබිය යුතු අතර, එම නිලධරයාට ලැබීමට හා ඉටු කිරීමට නියම කරනු ලබන සංග්‍රාමික පුහුණුව හා සංග්‍රාමික සේවය ලැබීමට හා ඉටු කිරීමට ද හැකි වනු පිණිස නිසි පහසුකම් සියල්ල සලසා දිය යුතු ය.

03. පළාත් රාජ්‍ය කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 134 රීතිය යටතේ වසර 05 ක උපරිම මුදාහැරීම් කාලය යන සීමාව ඉහත පරිදි කටයුතු කිරීමේදී ගැටළුවක් වන්නේ නම් එවැනි අවස්ථාවකදී බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කළයුතු බවට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.